# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ

**ගෙහිමියකු විසින් පරිශ්‍රයක පදිංචි වී සිටින තැනැත්තන් නෙරපීම වැළැක්වීම පිණිස ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා විසින්
2026 ජනවාරි මස 20 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2025 සැප්තැම්බර් මස 18 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

[47 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 58.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ

එල්.ඩී.- ඕ. 64/2023

**ගෙහිමියකු විසින් පරිශ්‍රයක පදිංචි වී සිටින තැනැත්තන් නෙරපීම වැළැක්වීම පිණිස ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2026 අංක   දරන පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

පනත අදාළ වීම

2. මේ පනතේ විධිවිධාන-

(අ) පරිශ්‍රයක නීත්‍යානුකූලව පදිංචි වී සිටින; සහ

(ආ) 3 වන, 4 වන හෝ 5 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති සිද්ධීන් සිදුවීමට පෙරාතුව මාස තුනකට වැඩි කාලසීමාවක් ඒ පරිශ්‍රයෙහි නිරවුල්ව සහ අඛණ්ඩව පදිංචි වී සිටින,

මේ පනතේ "පදිංචිකරු" යනුවෙන් සඳහන් කරනු ලබන තැනැත්තකුට අදාළ විය යුතු ය.

## I වන කොටස

## පදිංචිකරුවන්ට සලසනු ලබන ආරක්ෂාව

ගෙහිමියා විසින් සේවා හෝ පහසුකම් අත්හිටුවීම නොකළ යුතු බව

3. යම් පරිශ්‍රයක ගෙහිමියා, ඔහු විසින් ම හෝ වෙනත් යම් තැනැත්තකු මාර්ගයෙන් -

(අ) පදිංචිකරු වෙත කලින් සපයන ලද යම් සේවාවක් හෝ පහසුකමක් හෝ යම් අත්‍යවශ්‍ය සැපයුමක් හෝ උපයෝගීතා සේවාවක් නැවැත්වීම හෝ අත්හිටුවීම; හෝ

(ආ) පදිංචිකරු වෙත කලින් සපයන ලද යම් අත්‍යවශ්‍ය සැපයුමක් හෝ උපයෝගීතා සේවාවක් අලුත්වැඩියා කිරීම හෝ එය නිසි තත්ත්වයෙන් පවත්වාගෙන යාම

ප්‍රතික්ෂේප කිරීම, අත්හිටුවීම හෝ පැහැර හැරීම, හෝ අලුත්වැඩියා කිරීමට හෝ නිසි තත්ත්වයෙන් පවත්වාගෙන යාමට අවසරය දීම ප්‍රතික්ෂේප කිරීම,

නොකළ යුතු ය.

**ගෙහිමියා විසින් පරිශ්‍රයට අලාභ හානි නොකළ යුතු බව**

4. යම් පරිශ්‍රයක ගෙහිමියා හෝ ගෙහිමියා විසින් බලය දෙන ලද යම් තැනැත්තකු, ඔහු විසින් ම හෝ වෙනත් යම් තැනැත්තකු මාර්ගයෙන්, කෙළින් ම හෝ වක්‍රාකාරයෙන්, පදිංචිකරු ඒ පරිශ්‍රය හැරයාමට පෙළඹවීම පිණිස හෝ එසේ කිරීමට ඔහුට බල කිරීම පිණිස ඒ පරිශ්‍රයට අලාභ හානි කිරීම, එය කඩා බිඳ දැමීම හෝ ඒ සම්බන්ධයෙන් අයුතු යමක් කිරීම නොකළ යුතු ය.

**අධිකරණයක ආඥාවක් මත මිස පදිංචිකරුවකු නෙරපීම නොකළ යුතු බව**

5. යම් පරිශ්‍රයක ගෙහිමියා හෝ ගෙහිමියා විසින් බලය දෙන ලද යම් තැනැත්තකු, ඔහු විසින් ම හෝ වෙනත් යම් තැනැත්තකු මාර්ගයෙන්, අදාළ ලිඛිත නීතිය ප්‍රකාරව ගෙහිමියා සහ පදිංචිකරු අතර ඇතුළත් වූ යම් බදු ගිවිසුමක හෝ කුලී නිවැසි ගිවිසුමක නියම සහ කොන්දේසි හෝ නිසි බලය ඇති අධිකරණයක තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් උල්ලංඝනය කරමින්, ගෙහිමියා හෝ ගෙහිමියා විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් කුලියට දෙන ලද ඒ පරිශ්‍රයෙන් හෝ ඒ පරිශ්‍රයේ කොටසකින් පදිංචිකරු නෙරපීම හෝ නෙරපීමට සැලැස්වීම නොකළ යුතු ය.

## II වන කොටස

## සහන ලබා ගැනීම සඳහා නඩුවක් පැවරීම

**පදිංචිකරු විසින් ගෙහිමියාට විරුද්ධව නඩු පැවරීම**

6. (1) (මේ පනතේ "වගඋත්තරකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් පරිශ්‍රයක ගෙහිමියා, ඔහු විසින් ම හෝ වෙනත් යම් තැනැත්තකු මාර්ගයෙන්, කෙළින් ම හෝ වක්‍රාකාරයෙන්, 3 වන, 4 වන හෝ 5 වන වගන්තියෙහි සඳහන් ක්‍රියා හෝ නොකර හැරීම් එකක් හෝ ඊට වැඩි ගණනක් සිදු කරන අවස්ථාවක, (මේ පනතේ "පෙත්සම්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ පරිශ්‍රයේ අත්‍යප්තියට පත් පදිංචිකරු විසින් ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සිදු කිරීමෙන් එක් මාසයක් ඇතුළත, නඩුව පදනම් වන්නේ යම් හේතු මත ද ඒ හේතු සඳහන් කරමින් දිවුරුම් පත්‍රයක් මගින් සනාථ කෙරෙන පෙත්සමක්, වෙනත් යම් අදාළ කරුණු ද සමග ඉදිරිපත් කිරීම මගින්, පහත දැක්වෙන සහන එකක් හෝ වැඩි

ගණනක් ලබා ගැනීම සඳහා වූ ආඥාවක් ඉල්ලා සිටිමින් නිසි අධිකරණ බලය ඇති අධිකරණයෙහි නඩුවක් පවරනු ලැබිය හැකි ය:-

(අ) සේවාවන්, පහසුකම්, අත්‍යවශ්‍ය සැපයුම් හෝ උපයෝගීතා සේවා යථා තත්ත්වයට පත් කිරීම හෝ ඒ සේවාවන්, පහසුකම්, අත්‍යවශ්‍ය සැපයුම් හෝ උපයෝගීතා සේවා අලුත්වැඩියා කිරීමට සහ නිසි තත්ත්වයෙන් පවත්වාගෙන යාමට අවසරය දීම;

(ආ) වගඋත්තරකරු ඒ පරිශ්‍රයේ පදිංචිකරු වෙත හෝ පදිංචිකරුට විරුද්ධව යම් බලහත්කාරකමක් හෝ සාහසිකකමක් පෑමෙන් හෝ එසේ කරන බවට තර්ජනය කිරීමෙන් හෝ යම් අනතුරක්, හානියක් හෝ පාඩුවක් කිරීමෙන් හෝ එසේ කරන බවට තර්ජනය කිරීමෙන් වැළැක්වීම;

(ඇ) වගඋත්තරකරු පරිශ්‍රයට අලාභ හානි කිරීමෙන්, එය කඩා බිඳ දැමීමෙන් හෝ ඒ සම්බන්ධයෙන් අයුතු යමක් කිරීමෙන් වැළැක්වීම;

(ඈ) පෙත්සම්කරු පරිශ්‍රයෙහි හිස් වූ සහ නිරවුල් සන්තකයෙහි පිහිටුවීම; හෝ

(ඉ) අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් සහනයක්.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති සහනයක් ඉල්ලා සිටින යම් ආඥාවකට අමතරව, පෙත්සම්කරු විසින් පරිශ්‍රයේ යථා තත්ත්වය පවත්වාගෙන යාම පිණිස සහ 3 වන, 4 වන හෝ 5 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් සාවද්‍ය ක්‍රියාවක් සිදු කිරීමෙන් හෝ නඩුවේ අවසාන නඩු තීන්දුව නිෂ්ඵල විය හැකි වන එවැනි යම් සාවද්‍ය ක්‍රියාවක් සිදු කිරීමෙන් වගඋත්තරකරු වැළැක්වීම පිණිස අතුරු සහන ඉල්ලා සිටිය හැකි ය.

අධිකරණය විසින් පෙත්සම විභාග කිරීම

7. (1) 6 වන වගන්තිය යටතේ නඩුවක් පැවරීමෙන් අනතුරුව, පෙන්නුම් කර ඇති හෝ ඉදිරිපත් කර ඇති සාක්ෂිවලින් පෙත්සමෙහි ඇතුළත් වැදගත් කරුණු බැලූ බැල්මට පෙනෙන

පරිදි තහවුරු වන බවට අධිකරණය සෑහීමට පත්වුවහොත් සහ පෙත්සම්කරු විසින් ආයාචනය කර ඇති යම් සහනයකට හෝ සහන වැඩි ගණනකට ඔහු හිමිකම් ලබන බවට අධිකරණයේ මතය වන්නේ නම්, එවිට අධිකරණය විසින්-

(අ) ආඥාවේ නිශ්චිතව සඳහන් කර ඇති දිනයක දී වගඋත්තරකරු විසින් ආඥාවට විරුද්ධව හේතු දැක්වීම සිදු නොකළහොත් ආඥාව ක්‍රියාත්මක වන්නේ ය යන කොන්දේසිය පිට වූ නයිසයි ආඥාවක් කරනු ලැබිය යුතු ය; නැතහොත්

(ආ) පෙත්සමේ සඳහන් කාරණය තීරණය කිරීම සඳහා දිනයක් නිශ්චිතව සඳහන් කරමින් ද එසේ නිශ්චිතව සඳහන් කළ දිනයේ දී තත්කාර්යය සඳහා වගඋත්තරකරු අධිකරණය ඉදිරියෙහි පෙනී සිටින්නේ නම්, පෙත්සමට විරුද්ධව වගඋත්තරකරුගෙන් කරුණු විමසනු ඇති බවට ද දන්වමින් අතුරු ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල සඳහන් කරන ලද දිනය, අදාළ ආඥාව භාරදෙන ලද දිනයේ සිට දින දහහතරකට වැඩි නොවන දිනයක් විය යුතු ය.

(3) සිවිල් නඩු විධාන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ වගන්තිය යටතේ ආරම්භ කරන යම් නඩු කටයුත්තකට අදාළ විය යුතු ය.

(4) (අ) මේ පනත යටතේ ආඥාවක් සඳහා වන යම් ඉල්ලීමක් කඩිනමින් විභාග කර නිශ්චය කරනු ලැබිය යුතු අතර, අධිකරණය විසින්, දිවුරුම් පත්‍රයේ අන්තර්ගත කරුණු සහ පෙත්සම සමග පෙන්නුම් කර ඇති හෝ ඉදිරිපත් කර ඇති සාක්ෂි පිළිබඳව පමණක් සෑහීමට පත් වෙමින් පෙත්සමේ දිනයේ සිට මාස තුනක් ඇතුළත නඩු විභාගය අවසන් කළ යුතු ය.

(ආ) විරෝධතා ප්‍රකාශයක් මගින් විරුද්ධව කරුණු ඉදිරිපත් කිරීමට වගඋත්තරකරු ඉල්ලීමක් කරන අවස්ථාවක, අධිකරණය විසින්, ඒ විරෝධතා ප්‍රකාශය ලැබුණු දිනයේ සිට මාස නවයක් ඉකුත් වීමට පෙරාතුව නඩු විභාගය අවසන් කළ යුතු ය.

**විරුද්ධව කරුණු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කරනු ලබන ආඥා**

8. වගඋත්තරකරු අධිකරණය ඉදිරියෙහි පෙනී සිටින අවස්ථාවක හෝ 7 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව විරුද්ධව කරුණු ඉදිරිපත් කිරීමට ඉල්ලීමක් කරන අවස්ථාවක, නයිසයි ආඥාව බලාත්මක නොකිරීමට ප්‍රමාණවත් හේතු ඇති බවට අධිකරණය නිශ්චය කරන්නේ නම්, යුක්තිය ඉටු කිරීමට අවශ්‍ය විය හැකි පරිදි වගඋත්තරකරු විසින් ඉල්ලා ඇති නඩු ගාස්තු, සහන සහ වියදම් ගෙවන ලෙස අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

**සේවා ආදිය යථා තත්ත්වයට පත් කරන ලෙසට වූ ආඥාවකට අනුකූල වීමට අපොහොසත් වීම**

9. (1) යම් පරිශ්‍රයක් තුළ යම් සේවා, පහසුකම්, අත්‍යවශ්‍ය සැපයුම් හෝ උපයෝගිතා සේවා යථා තත්ත්වයට පත් කිරීම සඳහා අධිකරණය විසින් නයිසයි ආඥාවක් කරන අවස්ථාවක දී, අධිකරණය විසින් එම නයිසයි ආඥාව මගින් හෝ පසුව කරන ආඥාවක් මගින්, ඒ අදාළ ආඥාවේ නිශ්චිතව සඳහන් කර ඇති කාලසීමාව ඇතුළත දී ඒ නයිසයි ආඥාවට අනුකූලව කටයුතු කිරීමට වගඋත්තරකරු අපොහොසත් වන්නේ නම්, ඒ නයිසයි ආඥාව හෝ පසුව කරන ලද ආඥාව, එහි නිශ්චිතව සඳහන් කර ඇති ආකාරයට ක්‍රියාවේ යොදවනු ලැබිය යුතු බවට වැඩිදුරටත් ආඥා කරනු ලැබිය හැකි ය.

(2) වගඋත්තරකරු ඒ නයිසයි ආඥාවට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, අධිකරණය විසින් සිය මෙහෙයවීමෙන් ම හෝ නයිසයි ආඥාව අවසාන ආඥාවක් කරන ලෙසට පෙත්සම්කරු විසින් කරන ඉල්ලීමක් මත, ඒ නයිසයි ආඥාවේ හෝ පසුව කරන ලද ආඥාවක නිශ්චිතව සඳහන් කර ඇති ආකාරයෙන් ඒ නයිසයි ආඥාව ක්‍රියාවේ යොදවනු ලැබිය යුතු ය.

**පෙත්සම්කරු පරිශ්‍රයේ හිස් වූ සන්තකයෙහි පිහිටුවීම**

10. (1) පෙත්සම්කරු පරිශ්‍රයෙහි හිස් වූ සන්තකයෙහි පිහිටුවීමට අධිකරණය ආඥා කරන අවස්ථාවක, ආඥාවේ සඳහන් කරන ලද පරිශ්‍රයෙහි පදිංචි සියලු තැනැත්තන් නෙරපා හරිමින් පෙත්සම්කරු හිස් වූ සන්තකයෙහි පිහිටුවීමට අධිකරණය විසින් නොපමාව පිස්කල්ට විධාන කළ යුතු ය.

(2) පරිශ්‍රයෙහි හිස් වූ සන්තකයෙහි පෙත්සම්කරු පිහිටුවමින් අවසන් ආඥාව ක්‍රියාවේ යෙදවීමේ දී වගඋත්තරකරු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් පිස්කල්ට විරෝධය පාන හෝ බාධා කරන අවස්ථාවක දී, පිස්කල් විසින් ඒ විරෝධය පෑමෙන් හෝ

බාධා කිරීමෙන් පසු දින දහහතරක් ඇතුළත, ඒ විරෝධය පෑම හෝ බාධා කිරීම පිළිබඳව මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් අධිකරණය වෙත වාර්තා කරනු ලැබිය යුතු අතර, ඉන්පසුව අධිකරණය විසින්, ඒ විරෝධය පෑමෙන් හෝ බාධා කිරීමෙන් අධිකරණයට අපහාස කිරීම සම්බන්ධව ඔහුට විරුද්ධව ඉදිරි කටයුතු නොකළ යුත්තේ මන්ද යන්නට හේතු, ඒ දැන්වීමේ දිනයේ සිට දින දහහතරක් ඇතුළත දක්වන ලෙස නියම කරමින් වූ දැන්වීමක් ඒ විරෝධය පෑම හෝ බාධා කිරීම සිදු කළ තැනැත්තාට විරුද්ධව නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) (අ) පෙත්සම්කරු හිස් වූ සන්තකයෙහි පිහිටුවීමෙන් අනතුරුව එසේ පරිශ්‍රයේ සන්තකයෙහි පිහිටුවීමේ දිනයේ සිට අවුරුදු එකකුත් දින එකක කාල සීමාවක් ඇතුළත වගඋත්තරකරු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් පෙත්සම්කරුට අවහිර කරනු ලැබුවහොත් හෝ පෙත්සම්කරු පරිශ්‍රයේ සන්තකයෙන් පිටමං කරනු ලැබුවහොත් පෙත්සම්කරු විසින් ඒ අවහිර කිරීමේ හෝ පිටමං කිරීමේ දිනයේ සිට එක් මාසයක් ඇතුළත ඕනෑම අවස්ථාවක දී ඒ පිළිබඳ පැමිණිල්ලක් පෙත්සමක් මාර්ගයෙන් අධිකරණයට ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, එම පෙත්සමෙහි අවහිර කරන හෝ පිටමං කරන වගඋත්තරකරු හෝ වෙනත් තැනැත්තා වගඋත්තරකරුවන් වශයෙන් නම් කරනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ පෙත්සමක් ලැබුණු පසුව, අධිකරණය විසින් වගඋත්තරකරුවන් වශයෙන් එහි නම් කර ඇති පාර්ශ්වකරුවන් වෙත ඒ පෙත්සමේ පිටපතක් බැගින් භාරදිය යුතු අතර, ඒ අවහිර කිරීමෙන් හෝ පිටමං කිරීමෙන් අධිකරණයට අපහාස කිරීම සම්බන්ධව ඔවුන්ට විරුද්ධව ඉදිරි කටයුතු නොකළ යුත්තේ මන්ද යන්නට හේතු ඒ ආඥාවේ දිනයේ සිට දින දහහතරක් ඇතුළත දක්වන ලෙස ඔවුන්ට නියම කරනු ලැබිය යුතු ය.

(4) (2) වන හෝ (3) වන උපවගන්තිය යටතේ පිස්කල් විසින් කරන ලද වාර්තාව හෝ පෙත්සම්කරු විසින් ගොනු කරන ලද පෙත්සම විභාග කිරීමෙන් පසුව-

(අ) පැමිණිලි කරන ලද විරෝධය පෑම, බාධා කිරීම, අවහිර කිරීම හෝ පිටමං කිරීම මුල් පෙත්සමේ වගඋත්තරකරු විසින් හෝ ඔහුගේ පෙළඹවීම මත හෝ ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් සිදු කර ඇති බවට;

(ආ) පැමිණිලි කරන ලද විරෝධය පෑම, බාධා කිරීම, අවහිර කිරීම හෝ පිටමං කිරීම මුල් පෙත්සමේ වගඋත්තරකරු නොවන තැනැත්තකු විසින් සිදු කර ඇති බවට ද, ඔහු වෙනුවෙන් ම නැතහොත් මුල් පෙත්සමේ වගඋත්තරකරු නොවන වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් පරිශ්‍රයේ සන්තකය තමා දරන බවට වූ ඒ තැනැත්තාගේ හිමිකම් පෑම සද්භාවයෙන් වූවක් නොවන බවට; හෝ

(ඇ) වගඋත්තරකරු විසින් හෝ විරෝධය පෑම, බාධා කිරීම, අවහිර කිරීම හෝ පිටමං කිරීම සිදු කළ තැනැත්තා විසින් කරන ලද යම් හිමිකම්පෑමක් වේ නම් එය තහවුරු වී නොමැති බවට,

අධිකරණය සෑහීමට පත් වේ නම්, (5) වන, (6) වන සහ (7) වන උපවගන්තිවල දක්වා ඇති පරිදි ක්‍රියා කිරීමට අධිකරණය කටයුතු කළ යුතු ය.

(5) අධිකරණය විසින් (4) වන උපවගන්තිය අනුව-

(අ) පෙත්සම්කරු නොපමාව පරිශ්‍රයේ සන්තකයෙහි පිහිටුවන ලෙසට පිස්කල්ට විධාන කළ යුතු ය; සහ

(ආ) (4) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල සඳහන් පරිදි විරෝධය පෑම, බාධා කිරීම, අවහිර කිරීම හෝ පිටමං කිරීම සිදු කළ වගඋත්තරකරුට හෝ වෙනත් යම් තැනැත්තකුට අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකින් හෝ අවුරුදු එකකට නොවැඩි කාලසීමාවක බන්ධනාගාරගත කිරීමකින් හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකෙන්ම දඬුවම් කළ යුතු ය:

එසේ වුව ද, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 303 වන වගන්තියේ විධිවිධාන, මේ ඡේදය යටතේ බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් පනවනු ලැබ ඇති වරදකරුවකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(6) (4) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ සාවද්‍ය හිමිකම්පෑමක් සම්බන්ධයෙන් වන යම් නඩුවක දී වරද සිදු කරන ලද තැනැත්තා වරදකරු කරනු ලැබීමේ දී, ඔහු රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී අධිකරණය විසින් නඩු ගාස්තු, සහ නඩු විභාගය සඳහා සහ රිට් ආඥා නිකුත් කිරීම සඳහා දරන ලද අයකිරීම් සහ වියදම් සම්බන්ධයෙන් සුදුසු යයි අධිකරණය විසින් සලකනු ලබන ආඥාවක් කරනු ලැබිය හැකි ය.

අවසාන ආඥාව ක්‍රියාවේ යෙදවීම නතර නොකළ යුතු බව

**11.** (1) 12 වන වගන්තිය යටතේ නිසි අධිකරණ බලය ඇති ඉහළ අධිකරණයක් මගින් කරන ලද නිශ්චිත නතර කිරීමේ ආඥාවක් ඇත්නම් මිස, අධිකරණය විසින් කරන ලද යම් අවසාන ආඥාවක් ක්‍රියාවේ යෙදවීම නතර කරනු නොලැබිය යුතු ය.

(2) අධිකරණය විසින් අවසාන ආඥාව කරන ලද්දේ යම් පෙත්සම්කරුවකුගේ වාසියට ද, ඒ පෙත්සම්කරුට දැන්වීමක් කිරීමෙන් තොරව ඒ ඉහළ අධිකරණය විසින් ක්‍රියාවේ යෙදවීම නතර කිරීම සඳහා වන ආඥාවක් කරනු නොලැබිය යුතු ය.

අභියාචනා

**12.** මේ පනතේ විධිවිධාන යටතේ කරන ලද අවසාන ආඥාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු සිවිල් නඩු විධාන සංග්‍රහයේ 754 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව අභියාචනයක් කරනු ලැබිය හැකි ය.

අර්ථ නිරූපණය

**13.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ-

"සිවිල් නඩු විධාන සංග්‍රහය" යන්නෙන්, (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය අදහස් වේ;

"අධිකරණය" යන්නෙන්, නිසි අධිකරණ බලය ඇති දිසා අධිකරණය අදහස් වේ;

"නෙරපීම" යන්නෙන්, යම් පරිශ්‍රයක පදිංචිකරු සම්බන්ධයෙන් වන විට, ගෙහිමියා සහ පදිංචිකරු අතර ඇතුළත් වූ බදු ගිවිසුමේ හෝ කුලී නිවැසි ගිවිසුමේ විධිවිධාන උල්ලංඝනය කරමින් ඒ පදිංචිකරුට ගෙහිමියා හෝ ගෙහිමියා විසින්

බලය දෙන ලද යම් තැනැත්තකු විසින් කුලියට දෙන ලද ඒ පරිශ්‍රය සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක් පාවිච්චි කිරීමට සහ එහි පදිංචි වීමට ඇති අයිතිය ඍජු හෝ වක්‍රාකාර ක්‍රම භාවිත කරමින් අහිමි කිරීම අදහස් වේ;

“අත්‍යවශ්‍ය සැපයුම් හෝ උපයෝගීතා සේවා” යන්නට, ජලය, විදුලිය, මලපවහන සේවා, පිසීමේ ගෑස් සහ ප්‍රවේශ මාර්ගවල සහ තරප්පුවල විදුලි පහන් ද ඇතුළුව විදුලි පහන්, සෝපාන සහ කසලශෝධන හෝ සනීපාරක්ෂක සේවා සැපයීම ඇතුළත් වේ;

“ගෙහිමියා” යන්නෙන්, යම් පරිශ්‍රයකට අදාළව, පදිංචිකරුවකුගෙන් පරිශ්‍රයේ බදු කුලිය ලබා ගැනීමට හිමිකම් ලබන තැනැත්තා අදහස් වන අතර, මුල් ගෙහිමියාගේ ලිඛිත එකඟත්වය ඇතිව පරිශ්‍රය හෝ පරිශ්‍රයෙහි යම් කොටසක් අතුරු කුලී නිවැසියකුට කුලියට දෙන පදිංචිකරුවකු ද ඊට ඇතුළත් වේ;

“බදු ගැනුම්කරු” යන්නට, 2023 අංක 1 දරන බද්දට දී ඇති පරිශ්‍රවල සන්තකය ආපසු ලබා ගැනීමේ පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

“පදිංචිය” යන්නෙන්, පරිශ්‍රයකට හෝ පරිශ්‍රයක යම් කොටසකට අදාළව, ගෙහිමියා සමඟ වූ බදු ගිවිසුමක් හෝ කුලී නිවැසි ගිවිසුමක් යටතේ බදු ගැනුම්කරුවකු හෝ කුලී නිවැසියකු ලෙස ඒ පරිශ්‍රයේ පදිංචියට පැමිණ ගෙහිමියාගේ එකඟත්වය ඇතිව නිශ්චිත කාල සීමාවක් සඳහා අඛණ්ඩව පදිංචිවී සිටීම අදහස් වේ; සහ

“සන්තකය” සහ ”පරිශ්‍රය” යන්නට, 2023 අංක 1 දරන බද්දට දී ඇති පරිශ්‍රවල සන්තකය ආපසු ලබා ගැනීමේ පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## උපලේඛනය

[10(2) වගන්තිය]

### ආකෘති පත්‍රය

### විරෝධය පෑම සහ බාධා කිරීම පිළිබඳව පිස්කල් විසින් අධිකරණය වෙත ඉදිරිපත් කරන වාර්තාව

.......................... දිසා අධිකරණයේ විනිශ්චයකාරතුමා වෙත ය.

.......................... දිසා අධිකරණයේ පිස්කල්, ......................... වන මම මෙහි පහත උපලේඛනයේ සඳහන් පරිශ්‍රයේ හිස් වූ සන්තකයෙහි ....................................... (*පෙත්සම්කරුගේ නම*) පිහිටුවීමට 20............ මස ............. වන දින අධිකරණය විසින් කරන ලද අවසන් ආඥාව ක්‍රියාවේ යොදවන අතරතුර, 20............ ............... මස ............. වන දින .............................................. හි පදිංචි ....................................... (*වගඋත්තරකරුගේ හා/හෝ විරෝධය පෑම හා/හෝ බාධා කිරීම සිදු කළ වෙනත් තැනැත්තාගේ නම*) විසින් ......................................................................... ................ *(විරෝධය පෑම හා/හෝ බාධා කිරීම සිදු කළ ආකාරය විස්තර කරන්න)* මගින් මා හට විරෝධය පෑම හා/හෝ බාධා කිරීම සිදු කළ බව අධිකරණය වෙත මෙයින් වාර්තා කර සිටිමි.

<u>ඉහත සඳහන් පරිශ්‍රයේ උපලේඛනය</u>

*(අත්සන)*

.................................
*(පිස්කල්ගේ නම)*

20.................... මස ............. වන දින දී ය.